# මාර්ටින් වික්‍රමසිංහගේ සෙසු නවකතා සමඟ කරුවලගෙදර තුලනය කිරීමක්

සුසන්න මහඋල්පත

The paper is a comparative study between the novel 'Karuwala Gedara' of Martin Wikramasinghe, and his other novels. A similarity between the characters, background and general tempo of the novels included in the Trilogy of Wicramasinghe is a thing to be expected. But on closer examination we could also observe that his other novels which are considered to be different and indipendents showing a somewhat common ground in certain aspects and occasions. The purpose of this study is to analyse the similarities that could be detected in the novels, 'Gamperaliya' and the 'Karuwala Gedara'.

මාර්ටින් වික්‍රමසිංහගේ තුන් ඈඳුතු නවකතාවලියේ චරිත, පරිසරය හා සිදුවීම් අතර යම් යම් සමානතා තිබීම අපේක්ෂා කළ හැක්කකි. එහෙත් සියුම් ව විමසා බැලීමේ දී එක ම ලේඛකයාගේ එකිනෙකට වෙනස් යැයි සැලකෙන නිර්මාණ අතර වුව ද යම් යම් සමානතා හා සම්බන්ධතා පැවතිය හැකිය. මේ ලිපියේ අරමුණ වන්නේ තත් ලේඛකයාගේ **ගම්පෙරළිය** (1944) හා **කරුවල ගෙදර** (1963) යන කෘතිද්වයයෙහි සමානතා හා සම්බන්ධතා පරීක්ෂා කිරීමය. එවැනි කාර්යයක පළමුවැන්න මේ වන අතර සෙසු කෘතීන් හා කරුවල ගෙදර සංසන්දනයක නිරත වන්නේ මේ ලිපියේ ම ද්විතීය භාගයෙහි. එනිසා මෙය උක්ත මාතෘකාව යටතේ සම්පාදිත ලිපියක පළමු වන කොටස ලෙස සැලකිය යුතුය.

මාර්ටින් වික්‍රමසිංහ සිංහල නවකතාව බිහිවීමට පෙර සිට ම සිංහල ප්‍රබන්ධකථාව හා සම්බන්ධ වූ ලේඛකයෙකි. හේ 1914 දී රචනා කළ **ලීලා** නමැති කෘතිය අයත් වන්නේ ප්‍රබන්ධකථා ගණයටය. ඉන් අනතුරු ව වික්‍රමසිංහ රචනා කළ **සීතා** (1923), **සෝමා** (1922), **අයිරාංගනී** (1923) ආදී කෘති ද අයත් වන්නේ එම වර්ගීකරණයටමය. **රෝහිණී** (1929) කෘතිය මේවායින් තරමක් වෙනස් වන්නේ එය ඓතිහාසික ප්‍රබන්ධයක් ලෙසින් සලකන බැවිනි. වික්‍රමසිංහගේ මුල්කාලීන කෘති සියල්ල ම ප්‍රබන්ධකථා යන වර්ගීකරණයට ඇතුළත් කරන්නේ ඒවා නූතන නවකතා ශිල්පීය ලක්ෂණ අනුව නවකතා නම් ප්‍රවර්ගයට ඇතුළත් කරගත නොහැකි බැවිනි. වචනාර්ථය ගෙන සලකා බලන විට ප්‍රබන්ධකථාව යන්න නවකතාවට ද ආදේශ කරගත හැකි වුවත් අධ්‍යයන පහසුව තකා නවකතාව හා ප්‍රබන්ධකථාව දෙවර්ගයක් ලෙසින් සැලකීම යෝග්‍ය බව වැටහී යනු ඇත. එහෙත් මෙය විශ්ව සාහිත්‍යයේ